# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,692 — 1966 අප්‍රේල් 22 වැනි සිකුරාද — 1966.4.22**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| **පළාත් පාලන නිවේදන** .. .. .. | 289 | **ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන** .. .. | 299 |
| **සනාතුරු-ඇබෑර්තු** .. .. .. .. | 291 | **අය-වැය ලේඛන** .. .. .. | 301 |
| **විභාග, විභාග ප්‍රතිඵල ආදිය** .. .. .. | 296 | **දේපළ විකිණීම** .. .. .. | — |
| **අතුරු ව්‍යවස්ථා** .. .. .. .. | — | **මාර්ග කොමිටි දන්වීම** .. .. .. | — |
| **පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම** .. | 299 | **විවිධ දන්වීම** .. .. .. | 301 |


[**සැලකිය යුතුයි.**—1963 ජූලි සිට දෙසැම්බර් දක්වා නිකුත් අංක 13,691 සිට 13,898 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ.]

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 31/47

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත 84 වැනි වගන්තිය යටතේ වූ ආඥාව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 26 (2) (අ) වැනි වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින් ප්‍රසිද්ධ කරනු ලැබූ 1965 දෙසැම්බර 4 වැනි දින දරන දැන්වීමෙන්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මැදවච්චිය ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අංක 1 දරන ඡන්ද කොට්ඨාශය සම්බන්ධයෙන් තෝරා පත් කර ගැනීම සඳහා අපෙක්ෂකයන්ගේ නාම යෝජනා භාර ගැනීමේ දිනය වශයෙන් 1965 දෙසැම්බර විසි දෙවැනි දින නියම කරන ලද හෙයින් ද;

ඉහත කී ඡන්ද කොට්ඨාශය සඳහා තෝරා පත් කිරීම පිණිස, එකී දිනයේදී බලාපොරොත්තු නොවූ හේතූන් නිසා, කිසිම අපේක්ෂකයකු විසින් හෝ වෙනුවෙන් කිසිම නාමයෝජනා පත්‍රයක් තේරීම්භාර නිලධාරියාට භාර දීමට නුපුළුවන් වූ හෙයින් ද;

ඉහත කී ඡන්ද කොට්ඨාශය සඳහා තෝරා පත් කිරීම පිණිස අපෙක්ෂකයන්ගේ නාම යෝජනා කිරීම සඳහා විශෙෂ විධිවිධාන පැනවීම අවශ්‍යව ඇති හෙයින් ද;

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, මේ ආඥාවෙන්—

(1) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මැදවච්චිය ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අංක 1 දරන ඡන්ද කොට්ඨාශය සඳහා තෝරා පත් කර ගැනීම පිණිස අපෙක්ෂකයන්ගේ නාම යෝජනා භාර ගැනීම කළ යුතු වූ දිනය වශයෙන්, 1965 දෙසැම්බර විසි දෙවැනි දින නියම කරමින්, (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 26 (2) (අ) වැනි වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින් ප්‍රසිද්ධ කරනු ලැබූ 1965 දෙසැම්බර 4 වැනි දින දරණ දැන්වීම අවලංගු සහ බල රහිත විය යුතුවාක් මෙන්ම සෑම විටම එලෙස අවලංගු වූ සහ බල රහිත වී ඇති බව; සහ

(2) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින් ඉහත කී ඡන්ද කොට්ඨාශය සඳහා තෝරා පත් කරගනු ලැබීම පිණිස අපෙක්ෂකයන්ගේ නාමයෝජනා පත්‍ර භාර ගැනීම සඳහා වෙනත් දිනයක් නියම කරමින්, ඉහතකී වගන්තිය යටතේ අළුත් දැන්වීමක් ප්‍රසිද්ධ කළ යුතු බව

ප්‍රකාශ කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966.3.29,
කොළඹ දී ය.

4-761—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1966 පෙබරවාරි මස 11 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

ඇල්.ඞී.—බී. 69/41.
ජී.ජේ. 1/1/20.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ දුමහණ ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹදීය.

4-766—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඞී.—බී. 69/41.
ජී.ජේ. 1/2/7

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතෙහි 37 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අලුත්නුවර ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹ දී ය.

4-790—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඞී.—බී. 69/41.
ජී. ජේ. 1/2/14.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ එගොඩ පත පත්තු ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹදීය.

4-789—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 69/41.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟපළාත දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 ජනවාරි මස 30 වැනි දින,
කොළඹදීය.

4-787—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 69/41.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු පල්ලේ ගම්පහ උතුරු ගම් ප්‍රදේශයේ ගම්සභාවට, ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 ජනවාරි මස 30 වැනි දින,
කොළඹදීය.

4-786—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 69/41.
ජී ජේ. 1/2/5.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල පළාත ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹදීය.

4-785—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඞී.—බී 69/41.
ජී.ජේ. 1/1/21.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රුස්සගල ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹදීය.

4-784—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

## ගම්සභා ආඥා පනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත 257 වැනි අධිකාරය ගම්සභා ආඥාපනතෙහි 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලය ප්‍රකාර, දකුණු කොටස ඉහළ කොට්ඨාශයේ සහකාර පළාත් පාලන කොමසාරිස් හෙට්ටි ආරච්චිගේ පියදාස අභය වර්ධන වන මම ගාලු දිස්ත්‍රික්කයේ බටපොල ගම්සභාවෙහි අංක 2 නින්දාන දරණ කොට්ඨාශයෙහි සභික සන්තියාගු බුමන් ද සිල්වා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගනු ලැබීමෙන් පසු නොපැමිනි බව ගැන සෑහීමකට පත්ව, ගාලු දිස්ත්‍රික්කයේ බටපොල ගම්සභාවෙහි අංක 2 නින්දාන දරණ කොට්ඨාශයෙහි සභික සන්තියාගු බුමන් ද සිල්වා මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කිරීමේ දිනය සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

හෙට්ටි ආරච්චිගේ පියදාස අභයවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
(දකුණු කොටස ඉහළ)

4-767—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන (පාලන කොට්ඨාශ) පිළිබඳ ආඥාපනත 265 වැනි අධිකාරය

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ ඩී. ඊ. අබේසිංහ මහතා 1966 අප්‍රේල් මස 1 වැනි දා සිට නුවරඑළියේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන් පත් කර ඇති බැව් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
පළාත් පාලන කොමසාරිස්.

1966 අප්‍රේල් මස 6 දින,
කොළඹ දීය.

4-777—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අතිකූත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අතික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන්න ලෙස මේ තනතුරු වලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු සථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීනු.**—(i) අදාල පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස " නව ප්‍රවේශක නිලධාරීන්ටත් " නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුලත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම සථිර කිරීම අතිකූත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමා වෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුලතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න.)

(ඇ) **අධ්‍යාපනික සහ අතිකූත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගය කින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමර්ථ්‍යයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ආ) **කාර්යක්ෂමතා කඩඉම්.**—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවක් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම්ව සිටින්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණේ නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණේ නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

**(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### ———— තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදැහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

**සාමාන්‍ය අධ්‍යාපනය**

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

**වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය**

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2 | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්. ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්‍ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ සථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්‍ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්‍ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් —
සේනාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### ගණකාධිකාරි තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරුට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය.—රු. 4,080—360×11—රු. 8,040.

3. පහත සඳහන් අයගේ අයදුම්පත් සලකා බලනු ලැබේ :—

(අ) අදාළ ශ්‍රේණිවල පස් අවුරුද්දක් සේවය කොට ඇත්තාවූ ද, ලංකා කාර්මික විද්‍යාලයේ ගණක ශාස්ත්‍රය පිළිබඳව ඩිප්ලෝමාව ඇත්තාවූ ද, පළාත් පාලන සේවයේ විධායක ලිපිකරු පන්තියේ ලිපිකරුවන් හා පළාත් පාලන සේවයේ i වැනි ශ්‍රේණියේ හා ii වැනි ශ්‍රේණියේ පොත් තබන්නන් ;

(ආ) දස අවුරුදු සේවයක් සම්පූර්ණ කොට ඇත්තාවූ පළාත් පාලන සේවයේ i වැනි ශ්‍රේණියේ හා ii වැනි ශ්‍රේණියේ පොත් තබන්නන් ;

(ඇ) 6 අවුරුද්දක් විධායක ලිපිකරු පන්තියේ 2 වැනි ශ්‍රේණියේ සේවය කොට ඇති 10 අවුරුද්දක සේවය සම්පූර්ණ කළ පළාත් පාලන සේවයේ නිලධාරීන් ;

(ඈ) පළාත් පාලන සේවයේ i, ii, iii සහ iv වැනි ශ්‍රේණීන්හි ලේකම්වරු ;

(ඉ) v වැනි ශ්‍රේණියෙහි අවුරුදු 7 කට නොඅඩු සේවයක් ඇති v වැනි ශ්‍රේණියේ ලේකම්වරු ;

(ඊ) පළාත් පාලන සේවයෙහි තනතුරු දරන, පිළිගත් විශ්ව විද්‍යාලයයන්හි උපාධිධාරීහු.

4. සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට පහත සඳහන් නිර්දේශ පත්‍රයට අනුව ලිඛිත පරීක්‍ෂණයකට/ පෙනී සිටින ලෙස නියම කරනු ලැබේ :—

**1 වැනි ප්‍රශ්න පත්‍රය :** (පැය 3 යි.)

පිරිවැය ගිණුම් ඇතුළත් ගණන් තැබීම.

ද්විත්ව සටහන් පොත් තැබීමේ මූලධර්ම හා භාවිතය.

සීමිත වගකීම් සහිත සමාගම්වලට හා වෙනත් ව්‍යාපාරික සංවිධාන වලට අදාළ නිෂ්පාදන, වෙළඳ, ලාභාලාභ හා විසර්ජන ගිණුම් හා ශේෂ පත්‍ර පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, ආශ්‍රිත ක්‍රමයේ බැංකු සැසැඳුම් ප්‍රකාශ, මූල ධන හා ආදායම, වැරදි නිවැරදි කිරීම්, ප්‍රතිපාදන, සංචිත, සංචිත අරමුදල, ගිණුම්වල ක්‍ෂය ප්‍රමාණ, සිද්ධාන්ත හා භාවිත ක්‍රම හා විනිමය බිල්.

තීරු ක්‍රමය, තනි කොළ සහ පත් ලෑජර, අනු ශීර්ෂ පොත් තැබීම, ස්වයං සමතා ලෑජර, අසම්පූර්ණ සටහන් වලින් ගිණුම්, ලැබීම් හා ගෙවීම්, ආදායම් හා වියදම් ගිණුම්, ප්‍රේෂණ ගිණුම්, සාමාන්‍ය දිනය, කීර්ති නාමය, ලාභ නැතිවීම ඇතුළුව රක්ෂණ ඉල්ලුම් පත්, ද්විත්ව ගිණුම් ක්‍රමය, කීර්ති නාමය හා විසුරුවා හැරීම් භාවිතය ඇතුළුව සභාය

ගිණුම්, හවුල් ව්‍යාපාර, සීමා සහිත කොම්පැනි ගිණුම්, දෙපාර්තමේන්තු මය සහ ශාඛා ගිණුම්, කුලියට සින්නවීම් ගිණුම්, නිෂ්පාදන භාග, යන්ත්‍රානුසාර ගිණුම්.

**පිරිවැය**

පිරිවැය ගණන් තැබීමේ අදහස හා අරමුණ; ද්‍රව්‍ය, කම්කරු, පොදු කාර්ය සඳහා ගණන් තැබීම, අය වැය ලේඛනානුසාරී පාලනය, සම්මත පිරිවැය.

**2 වැනි ප්‍රශ්න පත්‍රය :** (පැය 2½යි.)

පළාත් පාලන මුදල් කටයුතු ඇතුළුව ගණන් පරීක්ෂාව හා මුදල් කටයුතු පිළිබඳ දැනුම.

ගණන් පරීක්ෂාවේ සාමාන්‍ය මූල ධර්ම, ගණන් පරීක්ෂාවේ අරමුණ හා විෂය සීමාව, ගණන් හරි වැරදි බැලීමේ ක්‍රමය හා ශිල්පීය ධර්මය, පරීක්ෂණ හරි වැරදි බැලීම්, ගණන් පරීක්ෂණ වැඩ සටහන්, මුදල් ගණුදෙනු ගණන් පරීක්ෂාව, වෙළඳ ගනු දෙනු, අපෞද්ගල ලැජරය, වත්කම් හා බැඳීම පිරික්සීම.

ගණන් පරීක්ෂකයන්ගේ බලතල, රාජකාරි හා බැඳීම්, කොම්පැණි ගිණුම්වල ගණන් පරීක්ෂාව, අභ්‍යන්තර ගණන් පරීක්ෂණ, විශේෂ ගණන් පරීක්ෂණ හා විමර්ෂණයන්, අභ්‍යන්තර පාලනය, පළාත් පාලන මුදල් කටයුතු පිළිබඳ දැනුම, පොදු මුදල් කටයුතු, සාමාන්‍ය මුදල් කටයුතු පිළිබඳ දැනුම.

**3 වැනි ප්‍රශ්න පත්‍රය :** (පැය 2½යි.)

පාළාත් පාලන නීතිය සහ ආණ්ඩුවේ පාලන හා මුදල් රෙගුලාසි.

5. මේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966 මැයි මස 10 වැනි දිනට හෝ ඊට පළමු, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලනාය තනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය පළාත් පාලනායතනයක නාගරික කොම සාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී ඇති බවට නාගරික කොමසාරිස් හෝ සභාපතිවරයා විසින් සහතික කොට, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. විභාගය පැවැත්වෙන දිනය සහ වේලාව පසුව දන්වනු ලැබේ.

10. සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති,

1966 අප්‍රේල් මස 7 වැනි දින,
තැ. පෙ 530,
කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

4-774—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### ජලකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජලනල අධිකාරී තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ නගර සභාවේ ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවට පත්කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය රු. 3,900—180 සහ 240—රු. 6,540. මේ වැටුප් ක්‍රමයෙහි රු. 5,580 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමකි.

3. **අවශ්‍ය සුදුසුකම්.—**

(1) පහත සඳහන් අයගෙන් අයදුම්පත් භාරගනු ලැබේ :—

(අ) කොළඹ නගර සභාවේ ජ්‍යෙෂ්ඨ ජලකර්මාන්ත පරීක්ෂකවරු සහ තමනට අදාළ ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයෙන් සමත්ව ඇති වෙනත් ප්‍රාදේශීය බලමණ්ඩලවල I වැනි II වැනි ශ්‍රේණිවල ජල කර්මාන්ත අධිකාරිවරු සහ සමාන තත්ත්වයේ වෙනත් නිලධාරීහු.

(ආ) පහත සඳහන් සුදුසුකම් වලින් එකක් හිමි, 1955 පළාත් පාලන සේවා වැටුප් ක්‍රමය යොදා ගැනීමට පූර්වයෙන් (එනම් 1955.11.12 දිනට පෙර) පරීක්ෂකයන් ලෙස පත් කරන ලද කොළඹ නගර සභාවේ ජලකර්මාන්ත පරීක්ෂකවරු :—

i. ලංකා කාර්මික විද්‍යාලයේ නාගරික ඉංජිනේරු ශිල්ප ඩිප්ලෝමාව.

ii. ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය (සිවිල්)

iii. ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ (තුන් අවුරුදු සන්ධ්‍යා කාල) අවසාන සහතිකය හෝ

iv. වෙනත් සමාන සුදුසුකමක්.

කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයෙන් සමත් වී නැති, මේ ගණයට අයත් නිලධාරීන් තෝරා ගනු ලැබුවහොත්, පත්වීමේ දිනයේ සිට අවුරුදු 2ක් ඇතුළතදී රෙගුලාසි අතුරු ව්‍යවස්ථා හා ආඥාපනත් ආදිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයෙන් සමත් වන ලෙස නියම කරනු ලැබේ. එසේ සමත් වීමට අපොහොසත් වුවහොත් ආපසු කලින් දැරූ තනතුරු වලට පත්කරනු ලැබේ.

(ඇ) 1964.4.1 දිනට ප්‍රථමයෙන් කොළඹ නගර සභාවේ පරීක්ෂක හෝ උප පරීක්ෂක තනතුරු දැරූ, දැනට රු. 4,620ක හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන කොළඹ නගර සභාවේ ජලකර්මාන්ත පරීක්ෂකවරු.

(ii) ඉහත සඳහන් කරන ලද සුදුසුකම් වලට අමතරව, අයදුම් කරුවන් වෙත—

(අ) ප්‍රධාන ජලනල හා ඊට අදාළ වැද්දුම්, නඩත්තුව හා අළුත් වැඩියාව පිළිබඳ යටත්පිරිසෙයින් පස් අවුරුද්දක පළපුරුද්ද.

(ආ) කොළඹ නගරයේ ජලය බෙදා හැරීමේ මූලික වැඩ කටයුතු පිළිබඳ දැනුම හා පළපුරුද්ද.

(iii) මිණුම් හා සමතලා කිරීම් පිළිබඳ දැනුමක් ඇති අය කෙරෙහි විශේෂ සැළකිල්ල දැක්වේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධ යෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට 1966.5.10 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනයවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා, හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. යෝග්‍යතා ඇති අපේක්ෂකයින්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුනු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 අප්‍රියෙල් මස 7 දින,
තැ. පෙ. 530,
කොළඹ.

4-764—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### තක්සේරු පරීක්ෂක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරා ගන්නා ලද අයදුම්කරුවෝ පළමු වරට කොළඹ මහා නගර සභාවට පත් කෙරෙති.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,860—120×17 සහ 180×8—රු. 5,340. මේ වැටුප් ක්‍රමයෙහි රු. 3,420 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයක් ද, රු. 4,800 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් ද වේ.

තෝරා ගන්නා ලද අයදුම්කරුවන් රු. 3,420 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම ඉක්මවීමට පළමු ලංකා කාර්මික විද්‍යාලයයේ තක්සේරු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමුවැනි වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වීමට නියම කෙරේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) 1966.5.10 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) (i) අයදුම්කරුවෝ ලංකා කාර්මික විද්‍යාලයයේ තක්සේරු ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවැනි වර්ෂයේ ශාස්ත්‍රීය පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කොට දෙවැනි වර්ෂයේ ශාස්ත්‍රීය පරීක්ෂණය සම්පූර්ණ කිරීමෙන් පසු, අගය ප්‍රමාණ කිරීම පිළිබඳ දැවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ නැතහොත් ගොඩනැගිලි කරුවන්ගේ ප්‍රමාණ සහ මිනුම් හා මට්ටම් කිරීම පිළිබඳ දැවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාවක් සමග ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ තුන් අවුරුදු සන්ධ්‍යා පෙළ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර, ඉහත සඳහන් සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව අගය ප්‍රමාණ කිරීම පිළිබඳ දැවුරුද්දක ප්‍රායෝගික පළ පුරුද්ද ලබා සිටිය යුතුය.

"(ආ) (i) හි සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ල දක්වනු ලැබේ."

4. අගය ප්‍රමාණ කිරීම පිළිබඳ අවශ්‍ය ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයදුම්කරුවන් නැති වුවහොත්, ප්‍රායෝගික පළපුරුද්ද නැති නමුදු ඉහත සඳහන් කාර්මික සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ අයදුම් පත් ද සලකා බලනු ලැබේ. එවැනි අයදුම්කරුවකු පත් කරනු ලැබුව හොත් පහත සඳහන් වැටුප් පියවරවල් මත තබනු ලැබේ.

අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද ඇති අය :—

1 වැනි වර්ෂය—රු. 1,740

2 වැනි වර්ෂය—රු. 1,860

කිසිදු ප්‍රායෝගික පළපුරුද්දක් නැති අය :—

1 වැනි වර්ෂය—රු. 1,620

2 වැනි වර්ෂය—රු. 1.740

3 වැනි වර්ෂය—රු. 1,860

එසේම ලංකා කාර්මික විද්‍යාලයයේ තක්සේරු ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවැනි වර්ෂයේ ශාස්ත්‍රීය පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන්ට, ප්‍රතිඵල නිකුත් වීම බලාපොරොත්තුවෙන් ඉල්ලුම් කර සිටිය හැක.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1966.5.10 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක, නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත, අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. යෝග්‍යතා ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 අප්‍රේල් මස 7 දින,
තැ. පෙ. 530,
කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

4-765—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### පණිවුඩකරු තනතුර—දළුගම, සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 480—30 × 4 හා 24 × 1—රු. 624.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(ආ) වයස : 1965.5.5 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු, 30ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුතුවාත් හැර බයිසිකල් පැදීමේ පුහුණුවලත් අය විය යුතුය.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල වල සථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොකතා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1966.5.5 වැනි දිනට හෝ ඊට පළමු දළුගම සුළු නගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ආර්. විජය ධර්මදාස,
දළුගම සුළු නගර සභාවේ සභාපති වෙනුවට.

1966 මාර්තු මස 29 වැනි දින,
දළුගම සුළු නගර සභා කාර්යාලය,
මහර, කඩවත.

4-411—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### මුරකරු තනතුර—දළුගම සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 540—30 × 8—24 × 1—රු. 804, රු. 636 සහ රු. 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) වයස : 1966.5.5 වැනි දිනට වයස අවුරුදු 25ට නොඅඩු, 40ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ. දෙවැනි භාෂාව පිළිබඳ ක්‍රියාත්මක දැනීමක් අතිරේක සුදුසුකමක් වනු ඇත. හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල සථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1966.5.5. වැනි දිනට හෝ ඊට පළමු දළුගම සුළුනගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ආර්. විජය ධර්මදාස,
දළුගම සුළු නගර සභාවේ සභාපති වෙනුවට.

1966 මාර්තු මස 29 වැනි දින,
දළුගම සුළු නගර සභා කාර්යාලය,
මහර, කඩවත.

4-422—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පළාත් පාලන භාෂා පරිවර්තකයින්ගේ සේවයේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1966

පළාත් පාලන භාෂා පරිවර්තකයින්ගේ සේවයේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක් (සිංහල) ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයින් සඳහා ලබන්නා මාසයේ කොළඹ දී පවත්වනු ලැබේ. විභාග දිනය පසුව දනුම් දෙනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස්වරයා විසිනි.

2. වැටුප් ක්‍රමය : සමත්වන අයදුම්කරුවන් රු. 1,620 න් පටන්ගෙන රු. 120 බැගින් 18 වරක් වැඩිවී, රු. 3,780 දක්වා නගින වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමි, පළාත් පාලන භාෂා පරිවර්තකයින්ගේ සේවයේ II වැනි ශ්‍රේණියේ තනතුරුවලට පුරප්පාඩු ඇතිවන අන්දමට පත්කරනු ලැබේ. රජයේ ප්‍රමාණයන්ට හා කොන්දේසිවලට අනුව ගෙවල් කුලී දීමනා ද, තාවකාලික ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනා ද ගෙවනු ලැබේ.

3. සේවාව පිළිබඳ කොන්දේසි—(ඒ) සාමාර්ථ්‍යය ලද පිරිමි අපේක්ෂකයෝ පත් කරනු ලබන දින පටන් තුන් අවුරුදු ආධුනිකත්වය ඇතිව මෙම සේවයට පත්කරනු ලබන්නාහ. ඔවුන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් සහිතය. සාමාර්ථ්‍යය ලද අපේක්ෂිකාවෝ පළමුවෙන් අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ පත්කරනු ලබන්නාහ. ඔවුහු පත්වීමේ දින සිට අවුරුදු තුනක පරීක්ෂණ කාල සීමාවකට යටත් වන්නාහ. එම අපේක්ෂිකාවන්ට අවුරුදු දහයක සේවය සම්පූර්ණ කිරීමට පෙර, ඕනෑම අවස්ථාවකදී විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයකට පැමිණීමට ප්‍රකාශ කළ හැක. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව නැවත එය අවලංගු කළ හැකි නොවේ. පරීක්ෂණ කාලසීමාව තුළදී එසේ කැමැත්ත දක්වන අපේක්ෂිකාවන්ගේ පත්වීම් ඉන්පසුව ආධුනික තත්ත්වයට පමුණුවනු ලැබේ. එසේ ආධුනික තත්ත්වයේ සිටිය යුතු කාලසීමාව තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවෙන් ඉතිරි කොටසට සමාන වනු ඇත.

(බී) නිවාඩු දීම හා අනිකුත් සේවා කොන්දේසි : පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන (264 වැනි පරිච්ඡේදය) හා ඒ යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලට යටත් වන සේ තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ අතුරු ව්‍යවස්ථාවන්ට හා රෙගුලාසිවලට අනුව නිගමනය කෙරෙයි.

(සී) ඔව්හු මාරු කිරීමට හැකි වන අතර, ලංකාවේ ඕනෑම ස්ථානයකට පත්කර යැවිය හැක.

(ඩී) සමත්වන අයදුම්කරුවෝ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු පිණිසද, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද, දනට පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ කිසියම් ව්‍යවස්ථාවක් වේනොත් ඊට අනුකූලව ක්‍රියා කළ යුත්තාහ.

4. සමත්වන අයදුම්කරුවන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කොට, පුරප්පාඩු ඇතිවන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

5. සුදුසුකම් : මෙම විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්—

(i) යහපත් චරිතයෙන් යුක්ත විය යුතුයි

(ii) * ලාංකිකයන් විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින්—

(1) සිංහල භාෂා විෂයයෙහි ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පොදු සහතිකය (උසස් පෙළ) හෝ ;

(2) සිංහල ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ;

(3) සිංහල විෂයයක් වශයෙන් ඇති (විශේෂ සිංහල නොවේ) උසස් පාඨශාලා සහතික පත්‍රය හෝ ;

(4) සිංහල විෂයයක් වශයෙන් ඇතිව ලන්ඩන් විශ්ව විද්‍යාලයේ කලා අංශයේ මධ්‍යම සහතිකය හෝ ලංකා විශ්ව විද්‍යාලයේ පොදු කලා විභාගයට සුදුසුකම් ලැබීමේ (ප්‍රථම) විභාග සහතිකය හෝ ;

(5) භාණ්ඩාගාරයෙන් පැවැත්වෙන සිංහල ප්‍රවීණතා විභාගයේ (උසස් පෙළ) සිංහල භාෂා විෂයයෙන් සාමාර්ථ්‍යයක්—

යන ප්‍රධාන සුදුසුකම් වලින් එකක් හා යටත් පිරිසෙයින් පහත සඳහන් අතිරේක සුදුසුකම් වලින් එකක් ද ලබා තිබිය යුතුයි.

(ඒ) ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථ්‍යයක් සහිතව ජූලි, 1957 දී හෝ ඉන් පෙර හෝ ප්‍රදානය කරන ලද ඉංග්‍රීසි භාෂාමය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ, ඕනෑම අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයකදී ඉංග්‍රීසි භාෂාව ' ඒ ' නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සම්මාන සාමාර්ථ්‍යයක් ඇතිව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ, ඉංග්‍රීසි භාෂාවෙන් මේවාට සමාන හෝ උසස් හෝ තත්ත්වයක් ඇතිව අන්‍ය විභාගයකින් සාමාර්ථ්‍යය.

(බී) ඉංග්‍රීසි භාෂාව ' ඒ ' නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථ්‍යය සහිත, විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ලබන ලද අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය).

සංලක්ෂ්‍යය—මෙම විභාගය සඳහා අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පෙර ප්‍රතිඵල පිට නොවී ඇති ඉහත සඳහන් කවර විභාගයකට හෝ පෙනී සිටි අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ අයදුම්පත් භාර ගනු නොලැබේ.

(iv) 1966 මැයි මස 13 වැනි දිනට අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ වයස අවුරුදු 19 ට නො අඩු වත් අවුරුදු 30 ට නො වැඩිවත් පැවතිය යුතුයි. සේවා අපේක්ෂකයින්ට ඔවුන් පසුගිය යුධයේදී ක්‍රියාකාරීසේවයේ සිටි කාලය ඔවුන්ගේ වයසින් අඩුකර ගත හැක.

6. විශේෂ සුදුසුකම්—

(i) 1966 මැයි මස 13 වැන දිනට පළාත් පාලන සේවයේ ස්ථිර තනතුරු දරන්නාවූ අයට පහත සඳහන් සුදුසුකම් තිබේ නම් වයස පිළිබඳ සීමාවක් නොමැතිව මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ඒ) 5 (iii) දරණ ඡේදයෙන් නියම කොට ඇති අධ්‍යාපනික සුදුසුකම් තිබිය යුතුයි.

(බී) ඔවුන්ගේ සේවය සතුටුදයක බවට ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා විසින් සහතික කළ යුතු අතර, භාෂා පරිවර්තකයින්ගේ සේවයට තෝරා ගනු ලැබුවහොත්, දනට දරන තනතුරෙන් නිදහස් කිරීමට සූදානම්ව සිටිය යුතුයි.

(ii) 1966 මැයි මස 13 වැනි දිනට පළාත් පාලන සේවයේ තාවකාලික තනතුරු දරන්නන්ට පහත සඳහන් සුදුසුකම් තිබේ නම් මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ඒ) 5 (iii) දරණ ඡේදයෙන් නියම කොට ඇති අධ්‍යාපනික සුදුසුකම් තිබිය යුතුයි.

(බී) 1966 මැයි මස 13 වැනි දින වන විට වයස අවුරුදු 45 ට අඩු විය යුතුයි.

(සී) යටත් පිරිසෙයින් 1966 මැයි මස 13 වැනි දින වන විට ඔවුන් අවුරුද්දක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කළ යුතු අතර, එම සේවය සතුටුදයක බව ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා විසින් සහතික කළ යුතුයි.

(iii) 5 (iii) වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපනික සුදුසුකම් ඇති 1966 මැයි මස 13 වැනි දිනට පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරු දරන්නන්ට වයස පිළිබඳව සීමාවක් නොමැතිව මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

7. අයදුම්පත්—(i) මෙම නිවේදනයේ අවසානයට දී ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව අයදුම්පත් පිළියෙල කළ යුතුයි. මේ සඳහා බාග ප්‍රමාණයේ ' ෆුල්ස්කැප් ' කඩදසි පමණක් පාවිච්චි කළ යුතුයි.

(ii) අයදුම්පත් 1966 මැයි මස 13 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ " පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති. තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලියුම් කවරයේ වම් පස මුදුනේ විභාගයේ නම පැහැදිලිව ලියා තිබිය යුතුයි.

(iii) අයදුම් පත්‍රවල රුපියල් 15 ක වටිනාකම ඇති මුද්දර අලවා යථා පරිදි අවලංගු කොට තිබිය යුතුයි.

(iv) දනට රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් සිය අයදුම් පත්‍ර එවිය යුත්තේ, තමන් දනට සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ ප්‍රාදේශීය බල මණ්ඩලවල ප්‍රධානීන් මාර්ගයෙනි. මෙසේ කිරීමට යම් අයදුම් කරුවකු අපොහොසත් වුවහොත් ඔහු/ඇ විභාගයට නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ. 1966 මැයි මස 13 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන් වෙත සිය අයදුම්පත් කල් වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ගෙන්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

8. සුදුසුකම් පිළිබඳ ලියවිලි—

(i) කිසිම ලියවිලි ආදියක් අයදුම් පතට අමුණා නොතැබිය යුතුය. එහෙත් වුවමනා කරුණු සියල්ලම අයදුම් පතෙහි සඳහන් කළ යුතුයි.

(ii) විභාගයේ දී සමර්ථතාවයක් දක්වූවන් විසින් විභාගයට පෙනී සිටීමට ඔවුන්ගේ සුදුසුකම් ලියවිලිලකින් ඔප්පු කළ යුතුයි. ඔවුන් එම ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලා සිටි කල්හි ප්‍රමාදව ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

(iii) පහත සඳහන් ලියවිලි අවශ්‍ය වෙනවා ඇත :—

(ඒ) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් (පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික පත්‍ර හෝ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ.)

(බී) පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිට ඒත්තු ගතහැකි වන යහපත් චරිතය පිළිබඳ වග කිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්, අයදුම්කරු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක අධ්‍යාපනය ලැබූවෙක් නම්, ඔහු අන්තිමවරට ඉගෙනුම ලැබූ රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවේ ප්‍රධානාචාර්ය වරයාගෙන් ලැබූ චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ නොමැති නම්, කැමති පරිදි අයදුම්කරුගේ ගුරුවරයා ගෙන් හෝ පාඨශාලාචාර්ය වරයාගෙන් හෝ ප්‍රසිද්ධ නිලධාරියකු ගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයෙකු ගෙන් හෝ අධිනීතිඥයකු ගෙන් හෝ නීතිඥයෙකුගෙන් හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ගෙන් හෝ සාමාන්‍ය වශයෙන් ඒ පිළිබඳව කරුණු සොයා බැලිය හැකි ප්‍රසිද්ධ පුද්ගලයෙකුගෙන් ලබාගත් චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

(සී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික පත්‍ර.

(ඩී) හඳුනා ගැනීමේ පත්‍රය.

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේදී වුවමනා සියළුම ලියකියවිලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ගෙන්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති විසින් ඉල්ලා සිටි විටෙක ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාදවන අපේක්ෂකයින්ගේ /අපේක්ෂිකාවන්ගේ ඇතුළත්වීම අවලංගු කරනවා ඇත.

සැ.යු.—(ඒ) නියමිත ආකෘති පත්‍රයේ නොලියන ලද අයදුම් පත්‍ර භාරගනු නොලැබේ.

(බී) මෙම විභාගයේ නීතිරීති වලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම් පත් භාරගනු නො ලැබේ.

9. **විභාගයට ඇතුළත් කර ගැනීම**—(i) පිළිගනු ලැබූ අයදුම් පත්‍ර හිමි අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

(ii) අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුයි. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(iii) විභාගය පැවැත්වෙන දිනට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ඒ බව වහාම—"පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරු සැපයිය යුතුයි :—

(ඒ) විභාගයේ නම :————.

(බී) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(සී) සම්පූර්ණ ලිපිනය :————.

**සැ. යු.**—විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට සළකනු නොලැබේ.

10. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

11. අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් ඉදිරිපත් කරන යම්කිසි තොරතුරක් ඔවුන් දැනුවත්ව අසත්‍ය බව පෙනී ගියහොත්, ඔවුන්ට පත්වීම් දෙනු ලැබුවත් සේවයෙන් පහ කරන්නට පිළිවන. සිතා මතා යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත් ඒ සමානම දඬුවම් ලැබීමට පිළිවන.

12. **මුදල් ආපසු දීම.**—කවර කරුණක් නිසාවත් මුද්දර ගාස්තු ආපසු දෙනු නොලැබේ.

13. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—ස්වකීය දෙපාර්තමේන්තුවල හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කරන පිළිගන්නා ලද අයදුම් පත්‍ර හිමි නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

14. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්.

(බී) මේ විභාගයේ දිනට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්.

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බල පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

15. **විභාග පරිපාටිය.**—විභාගය කොටස් දෙකකින් යුක්තය. පළමුවැනි කොටස ලිඛිත පරීක්ෂණය, දෙවැනි කොටස වාචික පරීක්ෂණය.

පහත සඳහන් වන්නේ විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයයක් වෙනුවෙන් නියමිත ලකුණුත්ය. අශෝභන අත් අකුරු ගැන හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැනද සියලුම ලිඛිත උත්තර පත්‍ර වලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිළි අකුරු ලියන ලද විභාග අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නුසුදුස්සන් බවට පත්වීමට ඉඩ තිබේ.

**1 වෙනි කොටස (ලිඛිත)**

විභාගයේ මෙම කොටස, එකක් පැය 3 බැගින් වූ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | ලකුණු |
|---|---|
| 1 වැනි පත්‍රය : සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම | |
| i. සාහිත්‍ය පාඨයක්, | |
| ii. සාමාන්‍ය පාඨයක්, | |
| iii. (අ) කාර්යාලයීය ලිපියකින් හෝ වාර්තාවකින්, සහ | |
| (ආ) ප්‍රවෘත්ති පත්‍ර ලිපියකින් හෝ වාර්තාවකින් උපුටා ගත් කොටසක් ... ... | 100 |
| 2 වැනි පත්‍රය :—ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම | |
| i. සාහිත්‍ය පාඨයක්, | |
| ii. සාමාන්‍ය පාඨයක්, | |
| iii. (අ) කාර්යාලයීය ලිපියකින් හෝ වාර්තාවකින් සහ | |
| (ආ) ප්‍රවෘත්ති පත්‍ර ලිපියකින් හෝ වාර්තාවකින් උපුටා ගත් කොටසක් ... ... | 100 |
| **2 වැනි කොටස** (වාචික පරීක්ෂණය) ... ... | 50 |

පළමුකොට ලිඛිත පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල අනුව තෝරා ගනු ලබන අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ කොළඹදී පැවැත්වෙන වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබෙති. වාචික පරීක්ෂණය පැවැත්වෙන දිනය ඔවුන්ට දන්වනු ලැබේ. පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් වාචික පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අපේක්ෂක සංඛ්‍යාව තීරණය කෙරෙනු ඇත.

16. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම් හා පත්වීම් දීම.**—සමත්වන අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රසිද්ධ කරනු ඇත. පුරප්පාඩු ඇති වන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ඇත.

17. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරා ගත් අපේක්ෂකයන් ලංකාවේ කවර පළාතක හෝ සේවය කිරීමට ශාරීරික වශයෙන් යෝග්‍ය බව ඔප්පු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 අප්‍රේල් මස 11 දින,
තැ. පෙ. 530,
කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

**සැලකිය යුතුයි.**—විභාගය පිළිබඳ කිසිම ලිපියක් සභාපති වරයාගේ පුද්ගලික නමට නොඑවිය යුතුයි.

*පළාත් පාලන සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම "ලාංකික" යන වචනයෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන්ය.

විභාග අංකය :
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි)

## පළාත් පාලන භාෂා පරිවර්තකයින්ගේ සේවයේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සිංහල විභාගය—1966

ඇතුළත්වීමේ අයදුම් පත්‍රය

1. (අ) ඔබේ පුරුදු අත්සන :————.
මුලකුරු සමග ඔබේ නම :————.
නම් සියල්ල (සම්පූර්ණයෙන් පැහැදිළි ලොකු අකුරින්) මහතා/මහත්මිය/මෙනෙවියද යන වග සඳහන් කරන්න :————.
(ආ) සම්පූර්ණ ලිපිනය (වෙනස්වූ වහාම දන්විය යුතුයි) :————.

2. (අ) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—
i. පරම්පරාවෙන්ද :————.
නැතහොත්,
ii. ලියා පදිංචිවීමෙන්ද :————.
(ආ) උපන් ස්ථානය—
i. අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ :————.
ii. අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ පියාගේ :————.
iii. අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ පිය පක්ෂයේ මුත්තාගේ :————.

| | දිනය | මාසය | වර්ෂය |
|---|---|---|---|
| 3. (අ) ඔබේ උපන් දිනය :– | ————. | ————. | ————. |
| (ආ) 1966 මැයි මස 13 වැනි දිනට ඔබේ වයස වර්ෂවලින් හා මාසවලින් :– | අවුරුදු ————. | මාස ————. | |

4. විභාගයට ඇතුළත්වීමට සුදුසුකම් ලැබීම සඳහා සමත්වී ඇති විභාග පිළිබඳ විස්තර— ප්‍රධාන අතිරේක
(අ) විභාගවල නම් සහ දිනයන් (ගැසට් නිවේදනයේ 5 වැනි ඡෙදය බලන්න.) :————.
(ආ) මධ්‍යස්ථානය :————.
(ඇ) විභාග අංක :————.
(ඈ) විෂයයන් හා එම විෂයයන් සමත්වූ ශ්‍රේණිය :————.

5. ගැසට් නිවේදනයේ 5 (IV) ඡෙදයේ සඳහන් සේවා මුක්ත අයට දෙනු ලබන අනුග්‍රහයන් යටතේ, විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන්නේ නම් පහත සඳහන් විස්තර සපයන්න :—
(අ) සේනාංකයේ සහ නිලයේ පදවි නාමය :————.
(ආ) ක්‍රියාත්මක සේවා කාලය :————.
(ඇ) සේවයෙන් අස් කළ දිනය :————.

6. ගැසට් නිවේදනයේ 6 (I) හෝ (II) වැනි ඡෙදය යටතේ දක්වෙන විශේෂ අනුග්‍රහයන් යටතේ විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන්නේ නම් පහත සඳහන් විස්තර සපයන්න :—
(අ) ඔබ පළාත් පාලන සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්—
i. දැනට දරන තනතුර :————.
ii. එයට පත් වූ දිනය :————.
(ආ) ඔබ ප්‍රාදේශීය බලමණ්ඩලයක තාවකාලික තනතුරක් දරන්නේ නම්—
i. දැනට දරණ තනතුර :————.
ii. එයට පත්වූ දිනය :————.
iii. 1966 මැයි මස 13 වැනි දිනට ඔබේ වයස :————.

7. ගැසට් නිවේදනයේ 6 (III) වැනි ඡෙදයේ සඳහන් විශේෂ අනුග්‍රහයන් යටතේ විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන්නේ නම් පහත සඳහන් විස්තර සපයන්න :—
i. දැනට දරණ තනතුර :————.
ii. එයට පත්වූ දිනය :————.

8. මීට ප්‍රථම රක්ෂාවක් කරනු ලැබුවේ නම් ඒ පිළිබඳ විස්තර—
(අ) ආයතනයේ/ස්වාමියාගේ/ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :————.
(ආ) දරූ තනතුර :————.
(ඇ) සේවය කළ කාලය :————.
(ඈ) සේවය නතර කිරීමට හේතුව :————.

9. කිසිම වරදකට ඔබ කවද හෝ වරදකරු කරනු ලැබ තිබේ නම් හෝ චෝදනා කරනු ලැබ තිබේ නම් හෝ ඒ වගත්, දිනය, වරදේ ස්වභාවය, උසාවියේ නම හා නඩු නොම්මරයත් සඳහන් කරන්න :————.

මෙහි සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බව මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් සහතික කරමි. තවද, මම මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමට බැඳෙමි. එසේම මේ විභාගය පිළිබඳ රෙගුලාසිවලට අනුව නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කරන ලද සේ සැලකීමට ඉඩ ඇති බවත් මම දනිමි.

> අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් අවශ්‍ය මුද්දර (රු. 15 යි) මෙහි අලවා ඒ මත දිනයද යොදා අත්සන් කළ යුතුයි.

————.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාව ගේ අත්සන

දිනය : 1966 ———— මස ———— වැනි දින.

සැ.යු.—රජයේ/පළාත් පාලන සේවයේ ස්ථිර හෝ තාවකාලික හෝ තනතුරු දරණ අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ යුත්තේ තමා සේවය කරන දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා ඉදිරිපිටයි. අනිකුත් අපේක්ෂකයින් අත්සන් කළ යුත්තේ සමාදාන විනිශ්චයකාරයෙකු හෝ ආදායම් පාලක නිලධාරියෙකු හෝ පෙරකදෝරු කෙනෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හෝ වර්ෂයකට රු. 2,400 ක් හෝ ඊට ඉහළ වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරියෙකු හෝ යුද්ධ හමුදාවේ හෝ නාවුක හමුදාවේ හෝ ගුවන් හමුදාවේ හෝ අධිකාරි ලත් නිලධාරියෙකු ඉදිරිපිටයි.

**අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම අයදුම්පත යම්කිසි තැනැත්තකු ඉදිරිපිට දී අත්සන් කරයි-ද, ඒ තැනැත්තාගේ සහතිකය**

———— පදිංචිකරුවෙකු වන, ———— මහතා/මහත්මිය/මෙනෙවිය මා පුද්ගලිකව අඳුනන බවත්, 1966 ———— මස ———— වැනි දින ඔහු/ඈ මා ඉදිරිපිටදී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බවත් සහතික කරමි.

————.
සහතික කරන අයගේ අත්සන.

නම, පදවි නාමය හා තරාතිරම :————.

ලිපිනය :————.

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය**

මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ 19———— මස ———— වැනි දින සිට ———— වශයෙන් ස්ථිර/තාවකාලික සේවයෙහි යෙදී සිටින බවද, ඔහුගේ/ඇගේ සේවය සෑම විටම සතුටුදායකව පැවති බවද සහතික කරමි.

————.
ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.

ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ නම :————

පදවිය :————.

දිනය :————.

4–788—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

**4 වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරින්ගේ සේවයට බඳවා ගැනීමේ විභාගය—1966. 1. 12**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයින් 4 වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරීන්ගේ සේවයට පත් කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරාගන් නා ලද බව මෙයින් දන්වනු ලැබේ:—

1. අබේවික්‍රම, වයි.—ගාල්ල නා. සභාව.
2. ආරියසේන, එම්. ඒ.—මාතර ප. ආ. සභාව.
3. ද මැල්, වී. අයි. පී.—පානදුරය ප. ආ. සභාව.
4. ද සේරම්, ඩබ්. ඒ. පී.—කුරුණෑගල නා. සභාව.
5. ප්‍රනාන්දු, කේ. එම්. එල්. බී.—මඩකලපුව ප. ආ. සභාව.
6. පොන්සේකා, සී. පී.—පානදුරය ප. ආ. සභාව.
7. ඉග්නේෂියස්, ඒ. ජේ.—බදුල්ල නා. සභාව.
8. පෙරේරා, ඩී. සී.—වත්තල ප. ආ. සභාව.
9. පියසේන, කේ.—කෝට්ටේ ප. ආ. සභාව.
10. වනිගසේකර, වී. ඩබ්ලිව්.—දෙනියාය ගම්සභාව.
11. වීරත්න, ඩබ්. එල්.—ගන්දහය උතුර ගම්සභාව.
12. විමලසේන, ජේ. වී.—දන්කොටුව සු. නා. සභාව.

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් ලබාදීමට කොමිසන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
ප. පා. සේ. කො. ස. ලේකම්.

1966 අප්‍රියෙල් මස 6 දින,
තැ. පෙ. 530—කොළඹ.

4-781—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

**වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරුවරුන්ගේ ශ්‍රෙණියට (විදුලි) උසස් කිරීමේ විභාගය—1966 ජනවාරි 14 සිට ජනවාරි 16 දක්වා**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල පහතින් සඳහන් වේ.

**පහත සඳහන් අපේක්ෂකයින් විභාගය සම්පූර්ණ කර ඇත :—**

| | | | |
|---|---|---|---|
| 1. | ගුණසේකර, එස්. | ... | කොළඹ නා. ස. |
| 2. | පෙරේරා, කේ. එච්. | ... | මහනුවර නා. ස. |
| 3. | පීරිස්, ඩී. ඩබ්. ඩී. | ... | කළුතර ප. ආ. ස. |
| 4. | වේරගොඩ, ආර්. | ... | මහනුවර නා. ස. |

**පහත සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දී ඇති විෂයයන්ගෙන් සමත්වී ඇත :—**

| | | |
|---|---|---|
| 5. | විජේසිංහ, ඩබ්. ඒ. ඩී. ඩී. ගාල්ල නා. ස. | (i) විදුලි බලස්ථාන ව්‍යවහාරය<br>(ii) ගොඩනැගිලිවල විදුලිය ස්ථාපනය |
| 6. | විජේතුංග, එල්. පී. නාවලපිටිය ප. ආ. ස. | (i) විදුලි යෝජනාක්‍රම<br>(ii) ගොඩනැගිලිවල විදුලිය ස්ථාපනය<br>(iii) සම්ප්‍රේෂණය හා බෙදා හැරීම<br>(iv) දෙපාර්තමේන්තු සංවිධානය හා මුදල් |

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
ප. පා. සේ. කො. ස./ලේකම්.

1966 අප්‍රේල් මස 6 දින,
තැ. පෙ. 530, කොළඹ.

4–780—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

# පළාත් පාලන ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

**මන්නාරම දිස්ත්‍රික්කය**

**වන්කාලෙයි ගම්සභාව**

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි කාරය වන) 36 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ, වන්කාලෙයි ගම්සභාවේ අංක 2 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා ආරෝක්‍යම් කුඤ්ඤ, මතේසු කුඤ්ඤ මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 අප්‍රේල් 6 වැනි දින,
කොළඹ දී ය.

4–608—66.4.22 දින අංක 14,692 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) (4) (1) (සී) වැනි වගන්තිය යටතේ, ඩබ්ලිව්. ජී. රූපසිංහ මහතා, 1966 මාර්තු මස 22 වැනි දින සිට කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරි තැන හැටියට පත් කරන්නට යෙදුන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල.)

1966 අප්‍රේල් මස 5 වැනි දින,
කොළඹ දී ය.

4-763—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

**1965 වර්ෂයේ ලැබීම් සහ ගෙවීම් වාර්තාවයි**

**ලැබීම්**

| | රු. ශ. |
|---|---|
| (ඒ) සාමාන්‍ය අය ... ... ... | 1,15,051 25 |
| (බී) මංමාවත් ... ... ... | 14,715 20 |
| (සී) තානායම් සහ අම්බලම් ... ... | 10,507 09 |
| (ඩී) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... ... | 9,573 77 |
| (ඊ) මහජන සෞඛ්‍ය ... ... ... | 40,393 89 |
| (එෆ්) මහජන ක්‍රීඩා ... ... ... | 14,750 0 |
| (ජී) සොහොන් බිම් ... ... ... | 313 0 |
| (එච්) සුනඛයින් ලියා පදිංචි කිරීම ... ... | 8 0 |
| (අයි) තරාදි පඩි සහ සේරු ... ... | — |
| (ජේ) විදුලි දෙපාර්තමේන්තුව ... ... | 1,30,871 99 |
| (කේ) ගින්නෙන් ආරක්ෂාවීම ... ... | — |
| (එල්) පළතුරු ගස් වැවීම (සැපයීම) ... ... | — |
| (එම්) කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | — |
| සම්පූර්ණ ආදායම ... | 3,36,184 19 |

**ගෙවීම්**

| | රු. ශ. |
|---|---|
| (ඒ) සාමාන්‍ය වැය ... ... ... | 58,657 42 |
| (බී) මංමාවත් ... ... ... | 43,197 69 |
| (සී) තානායම් සහ අම්බලම් ... ... | 14,311 16 |
| (ඩී) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 17,623 93 |
| (ඊ) මහජන සෞඛ්‍ය ... ... ... | 83,111 35 |
| (එෆ්) මහජන ක්‍රීඩා ... ... ... | 2,069 30 |
| (ජී) සොහොන් බිම් ... ... ... | 1,929 50 |
| (එච්) සුනඛයින් ලියා පදිංචි කිරීම ... ... | — |
| (අයි) තරාදි පඩි සහ සේරු ... ... | — |
| (ජේ) විදුලි දෙපාර්තමේන්තුව ... ... | 85,616 1 |
| (කේ) ගින්නෙන් ආරක්ෂාවීම ... ... | — |
| (එල්) පලතුරු ගස් වැවීම (සැපයීම) ... ... | — |
| (එම්) කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | 5,565 78 |
| සම්පූර්ණ වියදම ... | 3,12,082 14 |

| වෙනත් ලැබීම් | රු. | ශ. | වෙනත් ගෙවීම් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| තැන්පත් මුදල් ... ... ... | 35,503 | 94 | තැන්පත් මුදල් ... ... ... | 37,996 | 02 |
| අත්තිකාරම් මුදල් ... ... ... | 16,120 | 25 | අත්තිකාරම් මුදල් ... ... ... | 17,340 | 60 |
| රජයේ ආධාර (තානායම සඳහා) ... ... | 3,000 | 0 | නිවාස යෝජනා ක්‍රමය 7 වැනි පියවර සඳහා රජයේ ආධාර | 19,500 | 0 |
| රජයේ ආධාර (පුස්තකාලය) ... ... | 1,000 | 0 | පොදු වෙළඳ පල සඳහා ණය මුදල ... ... | 40,673 | 58 |
| වටිනාකම අඩුවීම—විදුලි දෙපාර්තමේන්තුව ... | 500 | 0 | රජයේ ආධාර (තානායම සඳහා) ... ... | 6,760 | 0 |
| පොදු වෙළඳ පල සඳහා ණය මුදල ... ... | 75,000 | 0 | රජයේ ආධාර (පුස්තකාලය) ... ... | 4,316 | 29 |
| | | | නිවාස යෝජනා ක්‍රමය 6 වැනි පියවර සඳහා ණය මුදල | 1,114 | 70 |
| | 1,31,124 | 19 | | 1,27,701 | 19 |
| 1964 දෙසැම්බර් මස 31 දිනට ශේෂය ... ... | 1,04,722 | 54 | 1965 දෙසැම්බර් මස 31 වෙනි දිනට ශේෂය ... | 1,32,247 | 59 |
| | 5,72,030 | 92 | | 5,72,030 | 92 |

අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ සභාපති, විජේමුණි සුසිරිපාල සොයිසා වන මම, ඉහත කී වාර්තාව මගේ උපරිම දැනීමේ සහ විශ්වාසයේ හැටියට අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව වෙනුවෙන් 1965 වර්ෂය තුළ ලබන ලද හා ගෙවන ලද සියළුම මුදල් පිළිබඳ සැබෑ හා නිවැරදි වාර්තාවක් යවට මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. සුසිරිපාල සොයිසා,
සභාපති.

ඉහතකී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.

ජී. ඇම්. පෙරේරා,
සහික අංක 5 කොට්ඨාශය.

වර් 1966ක්වූ අප්‍රේල් මස 7 වෙනි දින මා ඉදිරිපිටදී සහතික කරනලදී.

ආනන්ද සෝමවීර,
සමාදාන විනිශ්චකාර තැන.

1966 ක්වූ අප්‍රියෙල් මස 7 වෙනි දින,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා කායර්‍යාලයය.

**1965 ක්වූ දෙසැම්බර් මස 31 වෙනි දිනට වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාවයි**

| බැරකම් | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| තැන්පත් මුදල් ... ... ... | | | 55,771 | 54 |
| කියවීම් ශාලාවට ප්‍රදාන ... ... ... | | | 420 | 0 |
| විදුලි බල ක්ෂය සංචිතය ... ... | | | 20,320 | 0 |
| පුස්තකාලයට ප්‍රදාන ... ... ... | | | 2,259 | 36 |
| ප්‍රදාන, නිවාස යෝජනා ක්‍රමය 2 ... ... | | | 8,430 | 0 |
| ප්‍රදාන, නිවාස යෝජනා ක්‍රමය 6 ... ... | | | 52 | 32 |
| ප්‍රදාන නිවාස යෝජනා ක්‍රමය 7 ... ... | | | 500 | 0 |
| ප්‍රදාන, තානායමට ... ... ... | | | 990 | 0 |
| ණය ප්‍රසිධ වෙළඳපොල සඳහා ... ... | | | 39,071 | 77 |
| 1964 ශේෂය ... ... | 17,169 | 98 | | |
| 1965 අය ... ... | 3,36,184 | 19 | | |
| එකතුව ... | 3,53,354 | 17 | | |
| 1965 වැය ... ... | 3,12,082 | 14 | 41,272 | 03 |
| එකතුව ... | | | 1,69,087 | 02 |

| වත්කම් | රු. | ශ. |
|---|---|---|
| ස්ථාවර තැන්පත් මුදල් ... ... | 30,000 | 0 |
| අත්තිකාරම් ... ... ... | 4,839 | 43 |
| ලංකා සේවිස් බැංකුවේ තැන්පත් මුදල් ... ... | 2,000 | 0 |
| මුදල් පොතේ ශේෂය ... ... ... | 1,32,247 | 59 |
| එකතුව ... | 1,69,087 | 02 |

අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ සභාපති, විජේමුණි සුසිරිපාල සොයිසා වන මම, ඉහත කී වාර්තාව මාගේ උපරිම දැනුමේ සහ විශ්වාසයේ හැටියට සැබෑ හා නිවැරදි එකක් බවට මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. සුසිරිපාල සොයිසා,
සභාපති.

ඉහත කී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.

1966 ක්වූ අප්‍රේල් මස 7වෙනි දින අවිස්සාවේල්ලේ දී මා ඉදිරිපිටදී සහතික කරනලදී.

ජී. ඇම්. පෙරේරා,
සහික. අංක 5 කොට්ඨාශය.

ආනන්ද සෝමවීර,
සමාදාන විනිවයකාර තැන.

966 ක්වූ අප්‍රේල් මස 7 වෙනි දින,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා කායර්‍යාලයේදී ය.

# අය-වැය ලේඛන

## පෑලියගොඩ නගර සභාව

**1966 වර්ෂයේ පළමුවැනි පරිපූරක අයවැය ලේඛනය**

වැය ශීර්ෂය සහ උප ශීර්ෂය

| | |
|---|---|
| ඒ.—1(ඊ) විශ්‍රාම වැටුප් ... ... | 2,014 98 |
| 2(කේ) ජීවනාධාර සහ වි. ජීවනාධාර ... | 3,068 34 |
| ඊ—3(ඩී) අසූචි ඩිපෝකුලී ... ... | 1,050 00 |
| | **6,133 32** |

1966 මාර්තු මස 29 වැනි දින පැවැති රැස්වීමේ අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

වින්සන්ට් රාජපක්ෂ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1966 අප්‍රේල් මස 6 වැනි දින,
පෑලියගොඩ නගර සභා කායඹාලයේදී ය.

4-643—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## කන්තලේ සුළු නගර සභාව

**දෙවැනි අතිරේක වැය කෙටුම් පත—1966**

1 කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂයන් | මුදල් ප්‍රමාණය රු. | ශ. |
|---|---|---|
| බී.—මංමාවත් :— | | |
| (8) සංස්කරනය ... ... ... | 11,000 | 0 |
| සී.—නගර සභා ඉඩම සහ ගොඩනැගිලි :— | | |
| (7) අළුත් කර්මාන්ත ... ... ... | 600 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | | |
| (3) වැසිකිලි පවිත්‍ර කිරීම— | | |
| (ජී) ඉදිකිරීම ... ... ... | 1,500 | 0 |
| (5) ජල සම්පාදනය— | | |
| (ඊ) ඉදිකිරීම ... ... ... | 1,750 | 0 |
| එකතුව ... | 14,850 | 0 |

1966 ක්වූ පෙබරවාරි මස 26 වැනි ශනි දින පැවැත්වූ මාසික මහ සභ රැස්වීමේදී ත්‍රිකුණාමලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ සංශෝධනයට යටත්ව සභා සම්මත කරන ලදී.

එච්. ඩී. ඇල්. ලීලාරත්න,
සභාපති,
කන්තලේ සුළු නගර සභාව.

සුළු නගර සභා කායඹාලය,
කන්තලේ,
1966 මාර්තු මස 3 වැනි දින.

අනුමත කරන ලදී.

එන්. සිවරාජා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය.

1966 මාර්තු මස දින,
ත්‍රිකුණාමලය.

4-778—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

**නිවැරදිකිරීමක්**

1966 මාර්තු 4 වෙනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතරවෙනි කොටසේ 192 වෙනි පිටුවෙහි ප්‍රකාශයට පත්කර ඇති 1966 යේ පළමුවන අතුරු අය-වැය ලේඛනයේ වෙන් කර ඇති රුපියල් 15,000.00 ඕ.5.ඕ. ශීර්ෂය යටතේ නොව ඕ.5.ඊ. යටතේ ලෙස නිවැරදි කළ යුතුය.

ජී. ඒ. ඩී. ඇල්. තිලකරත්න,
වේයන්ගොඩ සුළු නගර සභාවේ සභාපති.

4-634/2—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## වේයන්ගොඩ සුළු නගර සභාව

**ජලභීතිකා රෝගය**

වේයන්ගොඩ සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් මෙම නගර සභා සීමාව තුළ පිහිටි, පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියෙකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥපනතේ 11 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශණය 1966 මාර්තු මස 23 වෙනි දින සිට 1966 සැප්තැම්බර් 30 වෙනි දින දක්වා වලංගුවේ.

ජී. ඒ. ඩී. ඇල්. තිලකරත්න,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

1966 මාර්තු මස 30 වෙනි දින,
වේයන්ගොඩ සුළු නගර සභා කාර්යාලයේදීය.

4-634/1—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## බෙන්තොට සුළු නගර සභාව

**1966 වර්ෂය සඳහා දේපල බද්ද**

### සුළු නගර සභා ආඥපනත (256 වැනි අධිකාරිය)

සුළු නගර සභා ආඥපනතේ (256 වැනි අධිකාරිය) යටතේ, පසුගිය වර්ෂයට බලපැවැත්වූ, පහත සඳහන් දේපල බදු 1966 වර්ෂයට ද එලෙසම පැනවීමට බෙන්තොට සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (11) වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනා කමින් සියයට හය බැගින් වූ වාර්ෂික බදු, පිළිවෙලින් ජූනි 30 වෙනිදාසින් හා දෙසැම්බර් 31 වෙනිදාසින් අවසන් වන අයුරින් අර්ධ වාර්ෂික වශයෙන් ගෙවිය හැකිවේ.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1966 ක්වූ අප්‍රේල් 5 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
බෙන්තොට.

4-776—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වාවූ (1 සහ 37 ඇතුළුව) කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට ඉබ්බාගමුව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඒ. ආර්. මොහමඩ් අලි,
ඉබ්බාගමුව ගම්සභාවේ සභාපති තැන.

1966 මාර්තු මස 7 වැනි දින,
ඉබ්බාගමුව ගම්සභා කායභීලයේදීය,
ඉබ්බාගමුව.

4-791—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ යටිපළාත කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන මෙහි පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ :—

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල XXXVIII වැනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට යටිපළාත කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

හ. ලියනගේ චිත්‍රපාල,
යටිපළාත ගම්සභාවේ සභාපති තැන.

1966 ජනවාරි මස 25 වැනි දින,
යටිපළාත ගම්සභා කාර්යාලයේදීය.
නිල්දන්ඩාහින්න.

4-772—66.4.22 දින අංක 14,692 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ.** සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

### 1966

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| මාර්තු | ... | 66. 3. 4 | සිකුරාද | ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 3.11 | සිකුරාද | ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 3.18 | සිකුරාද | ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 3.25 | සිකුරාද | ... | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් | ... | 66. 4. 1 | සිකුරාද | ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 4. 7 | බ්‍රහස්පතින්ද | ... | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66. 4.15 | සිකුරාද | ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 4.22 | සිකුරාද | ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 4.29 | සිකුරාද | ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි | .. | 66. 5. 6 | සිකුරාද | ... | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | | 66. 5.13 | සිකුරාද | ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 5.20 | සිකුරාද | ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 5.27 | සිකුරාද | ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජුනි | ... | 66. 6. 3 | සිකුරාද | ... | 66. 5.25 | බදාද | දවල් 12 |
| | | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | | 66. 6.16 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66. 6.24 | සිකුරාද | ... | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජුලි | ... | 66. 7. 1 | සිකුරාද | ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | | 66. 7. 8 | සිකුරාද | ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | | 66. 7.15 | සිකුරාද | ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | | 66. 7.22 | සිකුරාද | ... | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66. 7.29 | සිකුරාද | ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | ... | 66. 8. 5 | සිකුරාද | ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.12 | සිකුරාද | ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි “ඊස්ට්වර්න් පේපර් මිල්ස් කෝපරේෂන්” හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි